# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.09.19 පැය 1810 | | |
| දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1771/2025 |
| විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk | | |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**දේවගිරි රජමහා විහාරයේ වාර්ෂික පෙරහර හේතුවෙන් රථවාහන ගමනා ගමනය සීමා කිරීම - බිංගිරිය පොලිස් වසම.**

බිංගිරිය දේවගිරි රජමහා විහාරස්ථානයේ පෙරහර මංගල්‍ය 2025.09.20 වන දින බිංගිරිය සරණංකර ජාතික පාසල අසලින් ආරම්භ කර දේවගිරි රජමහා විහාරස්ථානය වෙත පැමිණීමට නියමිතව ඇත.

මෙම පෙරහර රාත්‍රී 07.30 සිට රාත්‍රී 11.00 දක්වා හලාවත කුරුණෑගල ප්‍රධාන මාර්ගයේ බෝවත්ත හන්දිය සිට තල්ගහපිටිය හන්දිය දක්වා වීථි සංචාරය කරන අතර, එම කාලය තුල පහත විකල්ප මාර්ග භාවිතා කරන ලෙස පොලිසිය රියදුරන්ගෙන් හා මහජනතාවගෙන් ඉල්ලා සිටියි.

**විකල්ප මාර්ග**

- **හලාවත සිට කුරුණෑගල දෙසට ගමන් ගන්නා රථවාහන :-**
  තල්ගහපිටිය හන්දියෙන් වැල්ලරාව දෙසට ගමන් කර වැල්ලරාව තල්ගහමුල හන්දියෙන් වමට හැරී කදුරුවැව හන්දිය දක්වා ගමන් කර දකුණට හැරී හොරගස්ආර නවරත්න හන්දියෙන් රුක්අත්තන වත්ත මාර්ගයේ ගමන් කර කඩිගමුව හන්දියෙන් වමට හැරී බෝවත්ත මාර්ගයේ ගමන් කර හලාවත කුරුණෑගල මාර්ගයට පිවිසිය හැකිය.

- **කුරුණෑගල සිට හලාවත දෙසට ගමන් ගන්නා රථවාහන :-**
  බෝවත්ත හන්දියෙන් කුලියාපිටිය මාර්ගයේ ගමන් කර කඩිගමුව හන්දියෙන් දකුණට හැරී රුක්අත්තන වත්ත මාර්ගයේ ගමන් කර නවරත්න හන්දියෙන් දකුණට හැරී බිංගිරිය දෙසට ගමන් කර කදුරුවැව හන්දියෙන් වැල්ලරාව මාර්ගයේ ගමන් කර තල්ගහපිටිය හන්දියෙන් දකුණට හැරී කුරුණෑගල හලාවත මාර්ගයට පිවිසිය හැකිය.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**